**මිනින්දෝරු දෙපාර්තමේන්තුව**
**1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සහ**
**2002 අංක 17 දරණ මැනුම් පනත යටතේ**
**මැනුම් සිදු කර කැඩැස්තර සිතියම් පිළියෙල කිරීම සඳහා වන**
**ප්‍රසම්පාදනයේ උපදෙස්, කොන්දේසි හා පිරිවිතර – 2026 වර්ෂය**

1. **උපදෙස්**

1.1 මිනින්දෝරු දෙපාර්තමේන්තුව 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සහ 2002 අංක 17 දරණ මැනුම් පනත යටතේ මැනුම් සිදු කර කැඩැස්තර සිතියම් පිළියෙල කිරීම සඳහා දිවයිනේ නම් කරන ලද දිස්ත්‍රික්ක 20 ක, කලාප 200 ක ඉලක්කගත වැඩ ප්‍රමාණයක් 2026 වර්ෂය තුල නිම කිරීම සඳහා සැලසුම් කර ඇත.

1.2 ලංසු ඉදිරිපත් කර ඇති ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවන්ගෙන් සුදුසුකම් ලබන ලංසුකරුවන් 200 කට වැඩි ප්‍රමාණයක් තෝරා ගැනීමට කටයුතු කරනු ඇත. ඒ අනුව අවම වශයෙන් කොළඹ - 12 ක් , ගම්පහ - 04 ක්, කළුතර -04 ක්, රත්නපුර - 10 ක්, කෑගල්ල -7 ක්, ගාල්ල - 07 ක්, මාතර -12 ක්, හම්බන්තොට - 17 ක්, මහනුවර - 09 ක්, මාතලේ -06 ක්, නුවරඑළිය -02 ක් , කුරුණෑගල - 11 ක්, පුත්තලම -4 ක්, අනුරාධපුරය - 24 ක්, පොළොන්නරුව - 26ක්, මොණරාගල - 20 ක්, බදුල්ල -8 ක් සහ යාපනය - 2ක්, අම්පාර- 13 ක්, මඩකලපුව - 2ක් ලෙස එක් එක් දිස්ත්‍රික්කය සඳහා ලංසුකරුවන් තෝරා ගැනීමට නිෂ්චය කර ඇත.

1.3 ඉහත සඳහන් දිස්ත්‍රික්ක සඳහා ලංසුකරුවන්හට ලංසු ඉදිරිපත් කළ හැකි අතර එක් ලංසුකරුවෙකුහට එක් දිස්ත්‍රික්කයක් සඳහා ඉදිරිපත් කළ හැක්කේ එක් ලංසු අයදුම්පතක් වුවද එක් අයෙකුට උපරිම වශයෙන් දිස්ත්‍රික්ක පහක් සඳහා ලංසු පත් ඉදිරිපත් කළ හැක. එසේ ඉල්ලුම් කරන විට ඉල්ලුම් කරන එක් එක් දිස්ත්‍රික්ක සඳහා වූ තම ප්‍රමුඛතා අංකයද (1-5 දක්වා) සඳහන් කළ යුතුය.

1.4 ගිවිසුම අත්සන් කළ දින සිට මාස 04 ක් ඇතුලත හෝ ඊට පෙර අදාළ කලාපයේ මැනුම් කටයුතු අවසන් කර සහ එකී කලාපයේ කැඩැස්තර සිතියම අධීක්ෂණ නිලධාරියාගේ පරීක්ෂාවට මෙන්ම ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අනුමැතිය සඳහා භාර දීමට කොන්ත්‍රාත්කරු කටයුතු කළ යුතුය.කැඩැස්තර සිතියම ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සම්මත කර ඉඩම් තොරතුරු පද්ධති අංශයට අංකිත දත්ත නිවැරදිව ලද බවට තහවුරු වීමෙන් අනතුරුව ලි.බ.මි. විසින් ඊළඟ කලාපය මැනුම් කිරීමට අයැදුම් කල හැකිය. ඒ සඳහා අනුමැතිය ලබා දීම අති.ස.ජ.(හිලි) විසින් සිදු කරනු ලබයි.

1.5 දෙපාර්තමේන්තුවෙහි මැනීමේ අවශ්‍යතාවය සහ රජයේ ඉඩම් මැනීමේ ජාතික ප්‍රතිපත්තිය මත පදනම්ව තෝරගත් දිස්ත්‍රික්කයක් තුල අති.ස.ජ.(හි.ලි) විසින් දිස්ත්‍රික් ජො.මි.අ.වරුන් වෙත දැනුම් දෙනු ලබන ග්‍රාම නිලධාරී කොට්ඨාශවල මැනුම් වැඩ සැපයීම කළ යුතුය. ලංසුකරුවෙකු හට මැනුම් වැඩ සැපයීමේදී අති.ස.ජ.(හි.ලි) විසින් දැනුම් දෙනු ලබන ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල පළමුව එක් කලාපයක මැනුම් වැඩ සපයනු ඇත. එම කලාපයේ සියළු වැඩ නිම වූ බවට අධීක්ෂණ භාර මිනින්දෝරු අධිකාරිගේ නිර්දේශය මත හා ලංසුකරු මැනුම් වැඩ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව තුල අත්කරගෙන ඇති විශ්වාසය හා සාර්ථක ලසුංකරුවකු බවට වන ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරි(දිස්ත්‍රික්/බිම්සවිය) ගේ විශ්වාසය මත එම කොට්ඨාශයේම තවත් කලාපයක වැඩ පැවරීම ලංසුකරුගේද ඉල්ලීම මත සිදු කළ හැකිය.

1.6 2026 සඳහා ගිවිසුම්ගත වන අවසාන කැඩැස්තර සිතියම **2026** නොවැම්බර් මස **15** දින හෝ ඊට පෙර ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරි හට අනුමත කිරීමට හැකිවන පරිදි අවසන් කර භාර දීමට හැකියාවක් ඇති බව ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරි තීරණය කරන්නේ නම් පමණක් 3.15 කොන්දේසියට යටත්ව තවත් කලාපයක මැනුම් කටයුතු සඳහා ගිවිසුම් ගත විය හැකිය.

1.7 ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා/ වරිය ගිවිසුම්ගත කලාපය තමා විසින්ම මැනුම් කටයුතු නිම කර පිඹුර ලබාදීමට බැඳී සිටින අතර, ගිවිසුම්ගත කාලය තුල එම කාර්යය ඉටුකර ගැනීම සඳහා 2026 වාර්ෂික බලපත්‍රය සහිත වෙනත් ලි.බ.මි. වරයකු/ වරියක ගේ සහය ලබා ගැනීමට අවසර දිය හැකි අතර ඒ සඳහා ගිවිසුම්ගත ලි.බ.මි. වරයා/වරිය තම ඉල්ලීම එම සේවය ලබා දීමට එකඟවූ ලි.බ.මි. වරයා/වරිය ගේ කැමැත්ත ප්‍රකාශ කරන ලද ලිපියද සමඟ අතිරේක සර්වේයර් ජනරාල් (හිලි) වෙතින් අනුමැතිය ලබා ගත යුතුය. මේ සඳහා ඇමුණුම 01 භාවිතා කර අති ස.ජ(හි.ලි) ගේ අනුමැතිය ලබා ගත යුතුය. යෝජනා කරනු ලබන ලි.බ.මි.වරයා 2026 සඳහා ගිවිසුම්ගත නොවූ අයෙක් හෝ ගිවිසුම්ගතවූ වැඩ සාර්ථකව නිමකර ඇති අයෙකු හෝ විය යුතුය. එහි දී ගිවිසුම්ගත ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා වෙනුවට ක්ෂෙත්‍ර වැඩ සහ පිඹුරු වැඩ කිරීමට එකඟවන ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයාද ක්ෂෙත්‍ර පොතෙහි මැනුම් කිරීමෙන් පසු අත්සන නම සහ ලියාපදිංචි අංකය සඳහන් කල යුතු අතර ඊට අදාල ගොනුවෙහි ද ඉහත සඳහන් ලෙස විස්තර ඇතුලත් කළ යුතුය.එනමුත් දිස්ත්‍රික් කාර්යාලයෙන් නව ක්ෂෙත්‍ර පොත් ලබා ගැනීමට හැකියාව ඇත්තේ ගිවිසුම්ගත ලි.බ.මිනින්දෝරුවරයාට පමණි. ගිවිසුම්ගත ලි.බ.මිනින්දෝරුවරයා මියගියහොත් හෝ පූර්ණ අකර්මණ්‍යතාවයට පත්වුව හොත් අති. ස.ජ(හි.ලි)ගේ ඉල්ලීම අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අනුව තෝරාගනු ලබන ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයාට පමණක් නව ක්ෂෙත්‍ර පොත් නිකුත් කල යුතුය. එසේ පිළියෙල කරනු ලබන කැඩැස්තර සිතියමට සහ ඉඩම් විස්තර ලැයිස්තුවට නව ගිවිසුම්ගත ලි.බ.මිනින්දෝරුවරයා විසින්ම අත්සන් කළ යුතුවේ.

1.8 කිසිවිටකවත් ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයාගේ වාර්ෂික බලපත්‍රය අත්හිටුවීමක් සිදුකොට ඇත්නම් කලාපයක මැනුම් කටයුතු සඳහා ගිවිසුම් ගත නොකිරීමට ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් කටයුතු කල යුතුය. ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා/ වරිය ගිවිසුම්ගත වීමෙන් පසු මැනුම් කටයුතු කරන අතර තුර යම් කරුණක් හේතුවෙන් තම වාර්ෂික බලපත්‍රය අත්හිටුවීමක් හෝ වෙනත් කිසියම් පෞද්ගලික හේතුවක් මත වැඩ නිම කිරීමට අපොහොසත් වුවහොත්, එහිදී කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට එකඟ විය හැකිය. නැතහොත් අති. ස.ජ(හි.ලි)ගේ ඉල්ලීම අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අනුව වෙනත් ලි.බ.මි. වරයා/වරියකට එම වැඩ පැවරීමට එකඟ විය හැකිය.

1.9 ලි.බ.මි. වරයා පිඹුර භාර දීමට පෙර ගිවිසුම් ගත කාලය තුල මියගිය හොත් හෝ පූර්ණ අකර්මණ්‍යතාවයට පත්වුව හොත් තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අනුව තෝරගනු ලබන ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයකුට අදාල මැනුම් වැඩ අවසන් කිරීම සඳහා අනුමැතිය ලබා දිය හැකිය . එහිදි ලි.බ.මි. වරුන් විසින් වෙන් වෙන් වශයෙන් සිදු කරන ලද වැඩ ප්‍රමාණය අනුව අධීක්ෂණ නිලධාරීයාගේ නිර්දේශය සහිතව ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දිය යුතු වේ.

1.10 දිස්ත්‍රික් මිල ගණන් අනුව මැනුම් වැඩ පැවරීමේ ලිපිය සර්වේයර් ජනරාල් හෝ ඔහුගේ ලියාපදිංචි බලයලත් නිලධාරියකු විසින් නිකුත් කරනු ලබන අතර, එම ලිපියේ සඳහන් නියමිත දිනට පෙර අදාළ කාර්යය පිළිගැනීමේ ලිපිය ලංසුකරු විසින් ලබා දිය යුතුය. පිළිගත හැකි හේතුවක් නොමැතිව නියමිත දිනයේදී මැනුම් වැඩ භාර නොගන්නා ලංසුකරුවන්ගේ ඉල්ලීම් පසුව සලකා බැලීමට කටයුතු නොකරන අතර එහිදී ඊළඟට සුදුසුකම් ලැබූ ලංසුකරුවන් හට කොන්ත්‍රාත් පිරිනැමීමට කටයුතු කරනු ඇත.

1.11 පවරනු ලබන මැනුම් වැඩවල කාර්ය සාධනය විධිමත්ව පාලනය කිරීම වෙනුවෙන් රු. 100,000/- ක් වටිනා කාර්ය සාධන බැඳුම්කරයක් මුදලින් හෝ 2027. 02. 28 දක්වා වලංගු වන පරිදි පිළිගත් බැංකුවක ඇපකරයක් මඟින් ගිවිසුම අත්සන් කිරීමට පෙරාතුව සාර්ථක ලංසුකරු විසින් ඉදිරිපත් කළ යුතුය. අදාළ කාර්යය සම්පූර්ණයෙන් අවසන් වී ලිත් මාස 03 ක් යනතුරු එම බැඳුම්කරය දෙපාර්තමේන්තුව භාරයේ තබා ගන්නා අතර, ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයාගේ මැනුම් වැඩ සම්බන්ධයෙන් පහත සඳහන් යම් විෂමතාවයක් හෝ රජයට යම් අලාභයක් සිදු වුවහොත් මෙම සම්පූර්ණ බැඳුම්කරයම රජයේ ආදායමට බැර කිරීමට ක්‍රියා කරනු ලැබේ. වැඩ සම්බන්ධයෙන් පහත සඳහන් යම් විෂමතාවයක් හෝ රජයට යම් අලාභයක් සිදු වුවහොත් මෙම සම්පූර්ණ බැඳුම්කරයටම රජයේ ආදායමට බැර කිරීමට ක්‍රියා කරනු ලැබේ.

වැඩ සම්බන්ධයෙන් පහත සඳහන් යම් විෂමතාවයක් හෝ රජයට යම් අලාභයක් සිදු වුවහොත් මෙම සම්පූර්ණ බැදුම්කරයම රජයේ ආදායමට බැර කිරීමට ක්‍රියා කරනු ලැබේ

I. භාර දෙනු ලැබූ ක්ෂේත්‍ර පොත් හා වෙනත් ලේඛණ ආපසු භාර නොදීම.
II. භාර දෙනු ලැබූ මායිම් ගල් විධිමත් ලෙස පියවීමට නොහැකි වීම.
III. මැනුමේ සහ සකස් කරන ලද පිඹුරේ නියම කරනු ලැබූ සංශෝධන සිදු නොකිරීම.
IV. නීත්‍යානුකූල නොවන අන්දමින් ක්ෂේත්‍ර මැනුම් කටයුතු සිදුකිරීම.
V. අදාල ගිවිසුම ප්‍රකාරව නියමිත මැනුම් වැඩ අවසන් කර පිඹුර භාර නොදීම.

2. <u>ලංසුඇගයීමේ ක්‍රියා පටිපාටිය</u>

2.1 සර්වේයර් ජනරාල් විසින් පත්කරනු ලබන තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් සිදුකරනු ලබන නිර්දේශ හා එක් එක් දිස්ත්‍රික්ක සඳහා අවශ්‍ය වන කොන්ත්‍රාත්කරුවන් ගණන අනුව සාර්ථක ලංසුකරුවන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය මඟින් තෝරාගනු ලැබේ.

2.2 **ලංසු ඉදිරිපත් කිරීමේදී පහත කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතුවේ.**

2.2.1 දිස්ත්‍රික්ක කිහිපයක් සඳහා ලංසු ඉදිරිපත් කරන විට ලංසු පත්‍රවල දිස්ත්‍රික් ප්‍රමුඛතාවයන් සඳහන් කිරීම.

2.2.2 ලංසු වලංගු කාලසීමාව අනිවාර්යයෙන්ම සඳහන් කිරීම හා ලංසු ඉදිරිපත් කරන දින සිට අදාල වර්ෂය අවසානය තෙක් වන කාලසීමාව තුල වීම.

2.2.3 ලංසු පත්‍රයේ 13 යටතේ ඇති 1.1, 1.2, 1.3, 1.4, 1.5, 1.6 හා 1.7 යන වර්ගීකරණයන් සියල්ලම යටතේ ලංසු අගයන් සඳහන් කිරීමට හා එසේ නොකරන ලද ලංසු පත්‍ර ප්‍රතික්ෂේප වීම.

2.2.4 තවද ලංසු පත්‍රයේ "අනිවාර්යයෙන් සඳහන් කල යුතුයි" ලෙස සඳහන් ප්‍රතීතන සහතික අංකය ඇතුලත් කිරීම හා ප්‍රතීතන සහතික නොමැති ලංසුකරුවන් ප්‍රතික්ෂේප වීම.

2.2.5 තාක්ෂණික ඇගයීම් කමිටුවට හා ප්‍රසම්පාදන කමිටුවට ප්‍රායෝගිකව පිළිගත හැකි ලංසු අගයන් ඉදිරිපත් කළ යුතු වීම.

2.2.6 එක් එක් දිස්ත්‍රික්කයන්හි ලංසුකරුවන් ලංසු අගයන් ලබා දීමේදී එකිනෙකාට ස්වාධීනව කටයුතු කළ යුතු වීම.

2.2.7 සර්වේයර් ජනරාල්ගේ අධීක්ෂණය යටතේ පෙර වර්ෂවල කැඩැස්තර මැනුම් වල (පසුකාලීන මැනුම් හැර ) යෙදී තිබේ නම් ඒ පිළිබඳව ඉල්ලුම්පත්‍රයේ නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුවීම.

2.2.8 ලංසු පත්‍ර එවීමේදී සන්නිවේදන මාධ්‍ය කුමක් වුවද **නියමිත දිනට සහ වේලාවට පෙර** ඉදිරිපත් කර නොතිබීම මත ලංසු පත්‍රය ප්‍රතික්ෂේප වේ.

2.3 <u>ලංසු ඇගයීම් කර සාර්ථක ලංසුකරුවන්ට කොන්ත්‍රාත්තු පිරිනැමීමේදී පහත කරුණු අනුව කටයුතු කරනු ලැබේ.</u>

2.3.1. තාක්ෂණික ඇගයීමේදී මීට ප්‍රථම දෙපාර්තමේන්තු අධීක්ෂණය යටතේ කැඩැස්තර මැනුම් වැඩ භාර ගෙන එම මැනුම් වැඩ වලට අදාල කැඩැස්තර පිඹුරු අවසන් නොකිරීම හෝ අනවශ්‍ය ලෙස මැනුම් වැඩ ප්‍රමාද කිරීම යනාදී කරුණු පිළිබඳව සලකා බලන අතර එවැනි කරුණු හේතුවෙන් පළාත් සර්වේයර් ජනරාල්වරුන් / ජ්‍යෙ.මි.අ. වරුන් විසින් තවදුරටත් මැනුම් වැඩ ලබා නොදීමට නිර්දේශ කරනු ලබන හෝ හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් යම් කැඩැස්තර පිඹුරක් සම්බන්ධයෙන් දන්වා එවනු ලබන සංශෝධන සිදු කිරීම පැහැර හැර ඇති හෝ අතිරේක සර්වේයර් ජනරාල් (හිමිකම් ලියාපදිංචි) විසින් පවත්වාගෙන යනු ලබන

අසාධු ලේඛණයේ නම් ඇතුලත්ව ඇති ලංසුකරුවන් වෙතොත් ඔවුන් ඇගයීම් ක්‍රියාවලියෙන් මෙන්ම කොන්ත්‍රාත් පිරිනැමීමෙන්ද ඉවත් කරනු ලැබේ.

2.3.2. ඉදිරිපත් කළ ලංසුපතෙහි 13 යටතේ ඇති 1.1, 1.2, 1.3, 1.4, 1.5, 1.6 හා 1.7 යන වර්ගීකරණයන් යටතේ ඇති ලංසු අගයන් පාදක කර ගනිමින් ඇගයුම් කරනු ලබන අතර දිස්ත්‍රික් ප්‍රමුඛතාවයන්ද සලකා බලනු ලැබේ.

2.3.3. එක් එක් දිස්ත්‍රික්කයන්හි ලංසුකරුවන් ලංසු අගයන් ලබා දීමේදී එකිනෙකාට ස්වාධීනව කටයුතු සිදුකර නොමැති බවට තහවුරු වන අවස්ථාවලදී ලංසු පත්‍රයේ සඳහන් එම ලංසු අගයන් ඇගයීම් ක්‍රියාවලියෙන් ඉවත් කරනු ලැබේ.

2.3.4. ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා ඉදිරිපත් කර ඇති ලංසු අගයන් අනුව එක් එක් දිස්ත්‍රික්ක සඳහා වන දිස්ත්‍රික් මිළ ගණන් තීරණය කරනු ලබන අතර එම මිළගණන් යටතේ අදාල දිස්ත්‍රික්කයට තෝරා ගනු ලබන සියළු සාර්ථක ලංසුකරුවන් ගිවිසුම්ගත විය යුතු වේ.

2.3.5. තාක්ෂණික ඇගයීම් කමිටුවට හා ප්‍රසම්පාදන කමිටුවට ප්‍රායෝගිකව පිළිගත හැකි ලංසු අගයන් ලංසුකරුවන් ඉදිරිපත් කර නොමැති විටදී ඉංජිනේරු ඇස්තමේන්තු අගයන් දිස්ත්‍රික් මිළ ගණන් ලෙස තීරණය කරනු ලැබේ.

2.3.6. ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා ඉදිරිපත් කරනු ලබන ලංසු අගයන් අනුව හා දිස්ත්‍රික් ප්‍රමුඛතාවයන් හා අවශ්‍ය වුවහොත් 2.2.7 හා 2.3.1 හි සඳහන් කරුණුද පදනම් කර ගනිමින් එක් එක් දිස්ත්‍රික්ක සඳහා ලංසුකරුවන්ගේ ප්‍රමුඛතා ලේඛන පිළියෙළ කරනු ලැබේ. ලංසුකරුවන් ඉල්ලුම්පතෙහි දිස්ත්‍රික් ප්‍රමුඛතාවය සඳහන් කර නොමැති විට ඉල්ලා ඇති දිස්ත්‍රික්ක අතරින් තෝරා ගැනීමට සුදුසුම දිස්ත්‍රික්කයකට තාක්ෂණික ඇගයීම් කමිටුව මඟින් නිර්දේශ කිරීමට කටයුතු කරනු ඇත.

2.3.7. ඉහත 2.3.4 හා 2.3.5 හි දැක්වෙන දිස්ත්‍රික් මිල ගණන් පිලිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ ඉදිරිපත් කරන අතර දිස්ත්‍රික්ක මිල ගණන් පිළිබඳව ප්‍රසම්පාදන මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ.

2.3.8. අනුමත දිස්ත්‍රික් මිල ගණන් යටතේ ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව දිස්ත්‍රික්කයන් සඳහා තෝරාගෙන ඇති සියළුම සාර්ථක ලංසුකරුවන්හට මැනුම් වැඩ පිරිනමනු ලැබේ.

2.3.9. එම අනුමත මිල ගණන් යටතේ මැනුම් වැඩ භාර ගැනීමට යම් ලංසුකරුවකු අකමැති වේ නම් ඒ වෙනුවට ප්‍රමුඛතා ලේඛණයේ සඳහන් ඊලඟ ලංසුකරුවා වෙත මැනුම් වැඩ පිරිනැමීමට කටයුතු කරනු ලැබේ.

2.3.10. ලංසුකරුවන් තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

## 3. කොන්දේසි

3.1 තම කලත්‍රයා මෙම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ නිළධාරියෙකු වශයෙන් සේවය කරන දිස්ත්‍රික්ක/කොට්ඨාශ තුළ කිසිම කොන්ත්‍රාත්කරුවෙකුට එම අධීක්ෂණ නිලධාරියාගේ ඍජු අධීක්ෂණය යටතේ මැනුම් වැඩ සැපයීම නොකරනු ලබන අතර, එසේ සිදුවී ඇති බව පසුව අනාවරණය වුවහොත් ප්‍රසම්පාදනයේ කොන්දේසි ප්‍රකාරව කටයුතු කර එම ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

3.2 ගිවිසුම අත්සන් කරන දිනය, කලාපයේ වැඩ ආරම්භ කරන දිනය ලෙස සලකන අතර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිඹුර සම්මත කරන දිනය කලාපයේ වැඩ අවසන් වන දිනය ලෙස සලකනු ලැබේ.

3.3 ගිවිසුම්ගත කාලය තුළ සම්පූර්ණයෙන් මැනුම් වැඩ නිම කරන ලද කැඩැස්තර සිතියම් හා අංකිත දත්ත දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට ලබාදිය යුතු අතර ගිවිසුම් ගත දිනට පසුව පිළිගත හැකි හේතු රහිතව ප්‍රමාද වන සෑම දිනක් සඳහාම බිල්පතේ සඳහන් මුළු මුදලින් ප්‍රමාද ගාස්තු අඩු කිරීමේදී පහත පරිදි සිදු කරනු ලැබේ.

| ප්‍රමාද වූ දින ගණන | ප්‍රමාද ගාස්තු ගණනය කරන ආකාරය |
|---|---|
| 1 සිට 30 දක්වා | සෑම දිනක් සඳහාම බිල්පතේ සඳහන් මුළු මුදලින් 3% ක් බැගින් |
| 31 සිට 60 දක්වා | බිල්පතේ සඳහන් මුළු මුදලින් 25% ක් |
| 61 සිට 120 දක්වා | බිල්පතේ සඳහන් මුළු මුදලින් 40% ක් |
| 120 ට වැඩි | බිල්පතේ සඳහන් මුළු මුදලින් සර්වේයර් ජනරාල් විසින් තීරණය කරනු ප්‍රතිශතයකින්<br>(පිළිගත හැකි හේතු ඉදිරිපත් නොකළ අවස්ථාවලදී අසාධු ලේඛන ගත කරනු ලැබේ.) |

3.4 අධීක්ෂණ නිලධාරීන් විසින් පිඹුරු පරීක්ෂා කිරීම සඳහා ගන්නා කාලය කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාද ගාස්තු සඳහා සලකනු නොලැබේ. නමුත් මිනින්දෝරු අධිකාරි හා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් ලබා දෙන සංශෝධන සිදු කරන දින ගණන, ලි.බ.මි. පිඹුර භාරදෙන දින සිට ගිවිසුම අවසන් වන දිනට ඇති දින ගණනට හිලව් කල හැකි අතර, එය ඉක්මවා යන විට ප්‍රමාද ගාස්තු අය කිරීමට යටත් වේ.

3.5 අධීක්ෂණය භාර මිනින්දෝරු අධිකාරී වෙත භාර දෙනු ලබන කැඩැස්තර සිතියමක් උපරිම දින 5ක් තුල පරීක්ෂා කර අවසන් කළ යුතු අතර, එසේ ලැබෙන කැඩැස්තර සිතියම උපරිම දින 5ක් තුල, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේදී පරීක්ෂා කර අනුමත කළ යුතුය. යම් නිළධාරියෙකු විසින් වැඩි ප්‍රමාදයක් සිදු කර ඇත්නම් එසේ ප්‍රමාද වූ සෑම දිනකටම 2% බැගින් අධීක්ෂණ ගාස්තුවෙන් අඩුකර ගෙවීම් කරනු ලැබේ.

3.6 ඉහත 1.11 හි සඳහන් I සිට V දක්වා වූ කරුණක් හෝ කිහිපයක් මෙම මැනුම් ක්‍රියාවලිය තුල සිදුවී ඇති බවට වාර්තා වන අවස්ථාවකදී එකී වෘත්තීය විෂමාචාරයන් පිළිබඳව අදාල කොන්ත්‍රාත්කරුට එරෙහිව මැනුම් සභාව වෙත පැමිණිලි කිරීමට සර්වේයර් ජනරාල්වරයා විසින් කටයුතු කරනු ලබන අතර, සර්වේයර් ජනරාල්වරයාගේ අභිමතය පරිදි ඔවුන්ගේ නම් දෙපාර්තමේන්තු මැනුම් වැඩ සැපයීම යටතේ අසාධු ලේඛනගත කිරීමටද කටයුතු කරනු ඇත.

3.7 අධීක්ෂණ නිලධාරියාගෙන් මායිම් ගල් ලබා ගත යුතු අතර, ඒවා ප්‍රවාහනය කර ගැනීම කොන්ත්‍රාත්කරුගේ වගකීමක් වේ.

3.8 මැනුම් වැඩ පවරන ලද යම් කලාපයක වැඩ සතුටුදායක ලෙස නිම කිරීමෙන් පසු ගිවිසගත් අගයන් ප්‍රකාරව එම කලාපය සඳහා ගෙවීම් සිදු කෙරේ. අත්තිකාරම් මුදලක් හෝ වෙනත් කිසිදු ගෙවීමක් ගිවිසුම් ගත වන අවස්ථාවේ සිදු නොකරනු ලබන අතර වැඩ අවසන් කරන අනු පිළිවෙලට කලාප මට්ටමින් ගෙවීම් කටයුතු සිදු කරනු ඇත.

3.9 කොන්ත්‍රාත්කරු එකතු කළ අගය මත බදු හෝ වෙනත් අදාල බදු ගෙවනු ලබන්නේ නම්, ඒ සඳහා දේශිය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ප්‍රවර්තන වර්ෂය සඳහා ලියාපදිංචිය තහවුරු කළ යුතු අතර වැට් අංකය හෝ අදාල අංකය ඇතුලත් විධිමත් බදු ඉන්වොයිස් පත්‍රයක් (Tax Invoice) ඉදිරිපත් කළ යුතුය.

3.10 රු. 25,000/- ඉක්මවා ගෙවීම් කරන විට සෑම ගෙවීමක් සඳහා කොන්ත්‍රාත්කරු විසින් ලබා දෙනු ලබන ලදු පත මත රු.25/- ක (රජයේ නියමිත) මුද්දර අලවා ඉදිරිපත් කළ යුතුවේ.

3.11 මැනුම් වැඩ සඳහා භාවිතා කිරීමට නියමිත මැනුම් උපකරණ, වැඩ පැවරීමට අදාල ගිවිසුම් අත්සන් කරන දිනට පූර්ව වසරක කාලයක් තුල ප්‍රමාණශෝධනය (Calibrate) කර තිබිය යුතු අතර, එම වාර්තාවද ඉදිරිපත් කළ පසු කොන්ත්‍රාත්කරුවන්හට මැනුම් වැඩ පැවරීම සිදුකළ යුතු අතර එසේ කටයුතු නොකරන කොන්ත්‍රාත්කරුවන්හට මැනුම් වැඩ ලබා නොදීමට කටයුතු කළ යුතුය.

3.12 සියලුම ක්ෂේත්‍ර සටහන් දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන ක්ෂේත්‍ර පොත් දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි වලට අනුකූලව සිදු කළ යුතුය. මිනින්දෝරු අධිකාරී විසින් පූර්ණමාණය භාවිතා කරමින් ක්ෂේත්‍ර පරීක්ෂාව සිදුකල යුතු අතර එය නිවැරදිව ක්ෂේත්‍ර පොත්වල ලේඛන ගත කල යුතුය. මිනින්දෝරු අධිකාරී විසින් ඉහතින් සඳහන් කර ඇති පරිදි ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කර ඇති ද යන්න ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරයා විසින් පරීක්ෂා කර තහවුරුකර ගත යුතුය.

3.13 ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා මැනුමට GNSS උපකරණ භාවිතා කර ඇතිවිට එම උපකරණය භාවිතා කර මිනින්දෝරු අධිකාරී විසින් මැනුම් කටයුතු සිදුකරනු ලබන කලාපයේ පවතින භූමි පාලන ලක්ෂ්‍ය වල ඛණ්ඩාංක නැවත ලබා ගෙන උපකරණය මගින් දෙනු ලබන දත්ත වල නිවැරදිතාවය තහවුරු කිරීම ක්ෂේත්‍ර පරීක්ෂාවේදී සිදු කල යුතුය.ඒ සඳහා ඇමුණුම 2 හි සඳහන් ආකෘති පත්‍රය භාවිතා කළ යුතු වන අතර එය අදාල මැණුම් ගොනුවෙහි ද ගොනුකල යුතුය.

3.14 මැනුම් අවසන් කළ පසු දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති TLDMS දත්ත පද්ධතිය භාවිතයෙන් ඉඩම් විස්තර ලැයිස්තු සැකසිය යුතුය. අධීක්ෂණය භාර මිනින්දෝරු අධිකාරී වෙත පරීක්ෂා කිරීම සඳහා එසේ සකසන ලද ඉඩම් විස්තර ලැයිස්තු දත්ත, කැඩැස්තර සිතියමේ හා එක් එක් කැබැල්ල සඳහා පිළියෙල කරනු ලබන කැඩැස්තර පිඹුරු (CAD Plans) ඇතුළු සියළුම ආංකිත දත්ත TLDMS දත්ත පද්ධතිය මඟින් උඩුගත කළ යුතුය. කැඩැස්තර සිතියමේ මුද්‍රිත පිටපතක්, මැනුම් ඉල්ලීම් ගොණුව සහ සියළුම ක්ෂේත්‍ර සටහන් භාර දිය යුතුය. අධික්ෂණ නිලධාරියා විසින් අදාළ සිතියම් පරීක්ෂා කිරීමෙන් පසුව සිතියමේ සහ ඉ.වි.ලැ වල අවසාන මුද්‍රිත පිටපත මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් සපයන නියැකීමේ පත්‍ර මත මුද්‍රණය කර අත්සන් තැබීමෙන් පසු අධීක්ෂණ නිලධාරියා වෙත භාර දුන් පසු ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත පිඹුර සම්මත කිරීමට ඉදිරිපත් කරනු ඇත.

3.15 එසේ ගිවිසුම අත්සන් කළ දින සිට මාස 04 ක් ඇතුලත පළමු කලාපයේ මැනුම් කටයුතු අවසන් කර සහ එකී කලාපයේ කැඩැස්තර සිතියම තම අධීක්ෂණ නිලධාරියා වෙත භාර දුන් පසු තවත් කලාපයක මැනුම් වැඩ සඳහා ගිවිසුම්ගත වීමට එම ලංසුකරු සුදුසුකම් ලබන බැවින් නොපමාව තවත් කලාපයක මැනුම් වැඩ සඳහා ගිවිසුම්ගත විය හැකිය. 1.6 හි සඳහන් උපදෙස් පරිදි **2026** **නොවැම්බර් මස 15** දින හෝ ඊට පෙර තවත් කලාපයක කැඩැස්තර සිතියම අවසන් කර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත භාර දීමට හැකි නම් **පමණක්** ඊලඟ නව කලාපය සඳහා අධීක්ෂණ නිලධාරීන්ගේ ලිඛිත නිර්දේශ සහිතව අති.ස.ජ.(හිලි) වෙතින් ඒ සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ඒ සඳහා ගිවිසුම්ගත කිරීම සිදු කළ යුතුය.

3.16 ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිඹුර සම්මත කිරීමට පෙර එහි කිසියම් සංශෝධනයන් ඇති බව පෙන්වා දෙනු ලැබුවහොත් එය අධීක්ෂණ නිලධාරී මඟින් නැවත දන්වන අතර, ඒ සඳහා ගත කරන කාලයට අදාල ප්‍රමාද ගාස්තු අධීක්ෂණ නිලධාරියාගෙන් සහ කොන්ත්‍රාත්කරුගෙන් අය කරනු ලබන අතර, එම සංශෝධන නිම කර පිඹුරු හා අංකිත දත්ත ආපසු අප්‍රමාදව භාර දිය යුතුය.

3.17 සෑම කලාපයකටම අදාල මැනුම් වැඩ අවසානයේදී දත්ත පත්‍ර ඉදිරිපත් කිරීමට පෙර සර්වේයර් ජනරාල්ගේ බලයලත් නිලධාරීන්ගෙන් ලබා ගනු ලබන සියළුම ද්‍රව්‍ය / ලේඛන භාර දී ලබා ගත් මායිම්ගල් තුලනය කර, ඒ සඳහා නිශ්කාෂණ ලබා තිබිය යුතු වේ.

3.18 සම්මත කරන ලද පිඹුරක නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 13 වන වගන්තිය අනුව වන විමර්ශනයේ දී පෙන්වා දෙනු ලබන සහ කොන්ත්‍රාත්කරුගේ වරදකින් සිදු වී ඇති දෝශයක් නිවැරදි කිරීම සඳහා කැඩැස්තර මැනුමේ හෝ සිතියමේ සිදුකළ යුතු සංශෝධනයක් වේ නම්, අදාල කොන්ත්‍රාත්කරු විසින් අය කිරීමකින් තොරව එම සංශෝධන සිදු කිරීමට බැඳී සිටියි.එම සංශෝධන දැනුම් දී උපරිම මාස 03 ක කාලයක් තුල අවසන් කර අදාල මිනින්දෝරු අධිකාරී වෙත භාර දිය යුතුය.නැවත කලාප ලබාදීමේ දී මේ සම්බන්ධයෙන්කටයුතු කර ඇති ආකාරය පිළිවඳව සලකා බලනු ඇත.

3.19 කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් බැහැර යම් අනපේක්ෂිත තත්වයන් මතම පමණක් ගිවිසුම් ගත කාලය තුල මැනුම් වැඩ අවසන් කිරීමට නොහැකි වන අවස්ථා වලදී එකී හේතුන් ගිවිසුම්ගත මැනුම් වැඩ අවසන් කළයුතු දිනට **දින 15කට වත් පෙර** නියමිත ආකෘති පත්‍රය මඟින් අධික්ෂණය භාර මිනින්දෝරු අධිකාරි වෙත දැනුම් දිය යුතුය. මෙසේ ඉදිරිපත් වන ඉල්ලීම් වෙනුවෙන් පමණක් ප්‍රමාද ගාස්තු සඳහා සහනයක් ලබා දීමට සලකා බලනු ඇත. එහිදි පළමු දින දීර්සය සඳහා උපරිම වශයෙන් දින 14 ක් ලබා දීමට **පළාත් සර්වේයර් ජනරාල්වරයා** හට බලය පවරනු ලබන අතර එහි විස්තර පළාත් සර්වේයර් ජනරාල් විසින් අතිරේක සර්වේයර් ජනරාල් (හිමිකම් ලියාපදිංචි) වෙත එවිය යුතුය. තවදුරටත් දින දීර්සයක් ලබා දීමට අවශා කරන්නේ නම් තම නිර්දේශ සහිතව පළාත් සර්වේයර් ජනරාල් විසින් එම අයදුම් පත අතිරේක සර්වේයර් ජනරාල් (හිමිකම් ලියාපදිංචි) වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය. එහිදි උපරිම දින 30 කාලයක් සඳහා පමණක් **අතිරේක සර්වේයර් ජනරාල් (හිමිකම් ලියාපදිංචි)** විසින් දින දීර්ස නිකුත් කරනු ඇත. මේ සඳහා ඇමුණුම 3 අකෘති පත්‍රය භාවිතා කළ යුතුය.

3.20 දින දීර්සයන් ලබා දීමේදී ගිවිසුම් ගත වර්ෂය තුල වැඩ නිම කිරීමට හැකි වන පරිදි දින දීර්ස නිකුත් කිරීමට කටයුතු කරනු ඇත. යම් හෙයකින් දින දීර්ස හේතුවෙන් මෙහි 1.6 හි උපදෙස් අනුව ඉදිරි කලාපයක වැඩ සිදු කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති යැයි අදාල දිස්ත්‍රික්කයේ ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරිහට හැඟී යන්නේ නම් අතිරේක සර්වේයර් ජනරාල් (හිමිකම් ලියාපදිංචි) ගේ උපදෙස් මත ගිවිසුමේ කටයුතු අවසන් කළ යුතුය.

3.21 කොන්ත්‍රාත්කරු ගිවිසුම් ගත කාලය තුල ප්‍රමාණවත් සතුටුදායක ප්‍රගතියක් පෙන්නුම් කළ යුතුය. ගිවිසුම් ගත කලාපයේ වැඩ අනවශා ලෙස ප්‍රමාද වන්නේ නම් ඒ බව දැනුවත් කරන අතර **ප්‍රතිචාරය සතුටුදායක නොවන්නේ නම්** මැනුම් කටයුතු සඳහා ගිවිසුම්ගත වීම එම කලාපයට පමණක් සීමා කරනු ඇත. අදාල කලාපයේ වැඩ උපරිම වශයෙන් සම්පූර්ණ ගිවිසගත් කාලය තුලද නිම කිරීමට අපොහොසත් වන්නේ නම් **කිසිදු ගෙවීමකින් තොරව** ගිවිසුමේ කොන්දෙසි වලට යටත්ව කොන්ත්‍රාත්තුව/ගිවිසුම අවලංගු කරනු ඇත. කලාපයකට අදාල උපරිම කාලය මාස 04 කි.

3.22 සර්වේයර් ජනරාල්වරයා හෝ ඔහුගේ බලයලත් නිලධාරියකු විසින් නම් කරනු ලබන අධීක්ෂණ නිලධාරියාගේ සමස්ථ අධීක්ෂණය යටතේ සියළු කාර්යයන් සිදු කළ යුතුය.

3.23 මැනුම් කලාපය සඳහා අවශා වන මූලික පාලන ලක්ෂා පිහිටුවා දීම පමණක් මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරන අතර, ඒ ඇසුරෙන් මැනුම් කලාපය ආවරණය කිරීමට යෝජිත පාලන පරික්‍රමණ ඇතුලත් පිරික්සුම් සටහනක් සකස් කර අධීක්ෂණ නිලධාරි මඟින් ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත ඉදිරිපත් කර මූලික අනුමැතිය ලබා ගත යුතුය. එසේ පූර්ව අනුමැතියක් නොමැතිව මැනුම් වැඩ කිසිසේත්ම ආරම්භ නොකළ යුතුය.

3.24 ගිවිසුම්ගත කලාපයක කැබලි සංඛ්‍යාව කැබලි 300 කට සීමා කළ යුතුය. නොවැලැක්විය හැකි හේතුන් මත ඉහත සීමාව ඉක්මවා යන්නේ නම් උපරිමය කැබලි 350 ක් දක්වා එම ගිවිසුම් ගත කලාපයේ කැබලි ප්‍රමාණය තබා ගත හැකි අතර, උපරිමය ද ඉක්මවා යන්නේ නම්, කලාප මායිම සංශෝධනය කර කැබලි සීමාව පවත්වා ගැනීමට හෝ කැබලි 350 ක් දක්වා පමණක් මැනුම් ගාස්තු ලැබීමේ හිමිකමට යටත්ව මැනුම් කටයුතු සිදු කළ හැකිය. මිනින්දෝරු අධිකාරි හා ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිරික්සුම් සටහන් සඳහා අනුමැතිය ලබා දීමේදී මේ සම්බන්ධව විශේෂ අවධානය යොමු කල යුතුය.

3.25 මැනුමට අදාල පැරණි ලේඛණ අධීක්ෂණ නිලධාරියාට දන්වා ලබා ගත හැකි නමුත් කිසිදු පැරණි ලේඛනයක් දෙපාර්තමේන්තු කාර්යාල වලින් පිටතට රැගෙන යාමට ඉඩදෙනු නොලැබේ.

3.26 කොන්ත්‍රාත්කරු විසින් මැනුම් වැඩ සඳහා ගිවිසගත් කලාපයේ ක්ෂේත්‍ර වැඩ සඳහා කාර්ය සැලැස්මක් සකස් කර එයටද අධීක්ෂණ නිලධාරියාගේ අනුමැතිය ලබා ගත යුතුය.

3.27 මැනුම් වැඩ සැපයු සෑම කලාපයක් තුලම මනින ලද සෑම ඉඩම් කැබැල්ලකම හිමිකම් කියන්නාගේ නම, ලිපිනය සහ අයිතිය සනාථ කළ ලේඛනයේ යොමු විස්තර ගොනුවේ ලේඛනගත කලයුතුය. ක්ෂේත්‍ර සටහන් දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි අනුව සකස්කර තිබිය යුතුය. යම් ඉඩම් කොටසක හිමිකම් කියන්නන් සොයා ගැනීමට අපහසු අවස්ථාවකදී ඒ බව එම කලාපයන්ට අනුයුක්ත කරන ලද විමර්ශන නිළධාරී සහ කොට්ඨාශයේ ග්‍රාම නිළධාරී වෙත දන්වා ඔවුන්ගේ සහාය ලබාගෙන කටයුතු කළ යුතුය. තවද ඒ සම්බන්ධව ඔවුන්ගෙන් ලබාගත් ලිඛිත සටහන්ද මැනුම් ඉල්ලීම් ගොනුවේ ගොනුකළ යුතුය. යම් කලාපයක මැනුම් කටයුතු කිරීමට විමර්ෂණ වාර්තා ලැබී තිබිය යුතු වන අතර, ඒ අනුව ඉ.වි.ලැ. හි හිමිකම් කියන්නාගේ නම ඇතුලත් කල යුතුය.

3.28 කොන්ත්‍රාත්කරුට ගිවිසුම් කාලය අවසන් වීමට පෙර ගිවිසුමෙන් ඉවත් වීමට අවශ්‍ය නම් ඔහුගේ ලිඛිත ඉල්ලීම මත අධීක්ෂණ නිලධාරීන්ගේ නිර්දේශ සහිතව අති.ස.ජ. (හිලි) ගේ අනුමැතිය යටතේ ගිවිසුම අවලංගු කළ හැකි නමුත් එවැනි අවස්ථාවක කොන්ත්‍රාත්කරු යම් වැඩ කොටසක් නිම කර තිබුණද ඒ සඳහා කිසිදු ගෙවීමක් සිදු නොකරනු ලබන අතර තැන්පත් කර ඇති සම්පූර්ණ බැදුම්කරයම රජයේ ආදායමට බැර කිරීමටද ක්‍රියා කරනු ලැබේ.

3.29 මිනින්දෝරු දෙපාර්තමේන්තු දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි හි සඳහන් සහ සර්වේයර් ජනරාල් විසින් ලබා දෙන කැඩැස්තර මැනුම් උපදෙස් වලට අනුකූලව මැනීම සහ ඇඳීම සිදු කළ යුතුය. කැඩැස්තර සිතියමට අදාල අංකිත දත්ත මැනුම් රෙගුලාසි හි සඳහන් නියමයන්ට මෙන්ම කැඩැස්තර මැනුම් සම්බන්ධයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛයන්ට ද අනුකූලව සකස් කළ යුතුය. එක් එක් බිම් කැබැලි සඳහා කැඩැස්තර පිඹුරු පිළියෙල කළ යුතු වන අතර ඒ සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව එය සිදු කළ යුතුය. මේ සඳහා දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි අදාල කර ගත යුතුය.

3.30 සියලුම මැනුම් (SLD 99) ජාතික ඛණ්ඩාංක පද්ධතියට සම්බන්ධ කර මැනුම් කළ යුතුය.

3.31 හිමිකම් නිරවුල් කිරීමේ සහකාර කොමසාරිස්වරයා විසින් අදාළ ප්‍රදේශයේ මැනිය යුතු බවට දන්වන හෝ මැනුම් කලාපය තුල ඇති මායිම් නිරවුල් බවට ක්ෂේත්‍රයේදී හඳුනා ගන්නා සියලුම ඉඩම් කැබලි වල මායිම් සඳහා (මායිම් ගල් ආඥාපනතට අනුව) මායිම් ගල් යොදා හෝ ස්ථිර මායිම් සහිතව මැනුම් කළ යුතුය.

3.32 මායිම් ආරවුල් සහිත හෝ අධිකරණ කටයුත්තක් සම්බන්ධයෙන් යොමු වී ඇති ඉඩමකට යාබදව පිහිටි ඉඩම් කැබලි සියල්ල එක් ඉඩම් කැබැල්ලක් (en-block) ලෙස මැනුම් කළ යුතුය. (මෙ සම්බන්ධයෙන් විමර්ශණ නිලධාරීන්ගේ එකගතාවය ලබාගෙන මැනුම් ඉල්ලීම් ගොනුවේ එම විස්තරය ඇතුලත් කල යුතුය)

3.33 අධීක්ෂණය භාර මිනින්දෝරු අධිකාරි වෙතින් ගැටළු සහිත ඉඩම් වල මැනුම් කටයුතු සඳහා වැඩිදුර උපදෙස් ලබා ගත යුතුය.

3.34 අධීක්ෂණ නිලධාරි මගින් හිමිකම් නිරවුල් කිරීමේ සහකාර/නියෝජ්‍ය කොමසාරිස්වරයා වෙත මැනුම් කලාපයක් තුල ඇති හිමිකම් කියන්නා අවිනිශ්චිත වන හෝ මායිම් ආරවුල් සහිත ඉඩම් අභිනිර්ණය කිරීම (adjudication) සඳහා එකවර යොමු කළ යුතු අතර අවශ්‍ය වේ නම් ඒ සඳහා අදාල ග්‍රාම නිලධාරිවරයාද විමර්ශන නිලධාරියාද සමඟ එක්ව ඒවායේ වැඩිදුර විමර්ශන කටයුතු සිදු කළ යුතුය.

3.35 ගිවිසුම් ගත ක්ෂේත්‍ර මැනුම් කටයුතු වල කොන්ත්‍රාත්කරු හෝ අතිරේක සර්වේයර් ජනරාල් (හිලි) ගේ පූර්ව අනුමැතිය ලබා ගත් ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයකු හැර වෙනත් අය යෙදවීම නොකළ යුතු අතර, එසේ කළ බව තහවුරු වුවහොත් ගාස්තු ගෙවීමකින් තොරව, ගිවිසුමේ කොන්දේසි වලට යටත්ව කොන්ත්‍රාත්තුව අවසන් කරනු ඇත.

4. <u>පිරිවිතර</u>

4.1 ලංසුකරුවන් 2025 වසර සඳහා මැනුම් වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍රය හිමි සහ / හෝ 2026 වසර සඳහා වාර්ෂික බලපත්‍ර ලබා ගැනීමට සුදුසුකම්ලත් ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් විය යුතුය. නමුත් මැනුම් වැඩ සඳහා වූ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලබන්නේ 2026 වර්ෂය සඳහා වාර්ෂික බලපත්‍රය ලබාගෙන ඇති සාර්ථක ලංසුකරුවන් වෙත පමණි.

4.2 තවද එම ලංසුකරුවන් බිම්සවිය මැනුම් වැඩ වල යෙදීමට අවශ්‍ය ප්‍රතීතන සහතිකයද ලබා තිබීම අනිවාර්ය වේ.

4.3 අවසන් තීරණය , යම්කිසි ගැටළුවක් හෝ උපදෙස් ලබා දීමක දී අවසන් තීරණය ලෙස සැලකිය යුත්තේ අතිරේක සර්වේයර් ජනරාල්(හි.ලි) විසින් ලබා දෙන ලබන තීරණයයි.

5. <u>බිල්පත ඉදිරිපත් කිරීම</u>

නිශ්චිත කාලය තුල වැඩ අවසන් කල වහාම කොන්ත්‍රාත්කරු විසින් මැනුමට අදාල වන බිල්පත ඇමුණුම 10ට අනුව සකස් කර අධීක්ෂණ නිලධාරියා වෙත ඉදිරිපත් කල යුතුය. එහි සඳහන් කල යුත්තේ අවසන් ගාස්තුව සඳහා උපයෝගී කර ගන්නා කැබලි පමණි.

# ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

## 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සහ 2002 අංක 17 දරණ මැනුම් පනත යටතේ මැනුම් සිදුකර කැඩැස්තර සිතියම් පිළියෙල කිරීම.

## ලංසු පත්‍රය - 2026.

ඉල්ලුම් කරන දිස්ත්‍රික්කය :- ......................................

එම දිස්ත්‍රික්කය සඳහා ඔබේ මනාප අංකය :- ......................................

(ඉල්ලුම් කළ හැකි දිස්ත්‍රික්ක - කොළඹ, ගම්පහ, කළුතර, රත්නපුර, කෑගල්ල, ගාල්ල, මාතර, හම්බන්තොට, කුරුණෑගල, පුත්තලම, මහනුවර, මාතලේ, නුවරඑළිය, අනුරාධපුරය, පොළොන්නරුව, මොණරාගල, බදුල්ල, යාපනය,අම්පාර හා මඩකලපුව)

ආපසු නොගෙවනු ලබන ගාස්තුව ගෙවූ ලදුපත් අංකය :-........................

(ලදුපතෙහි මුල් පිටපත අමුණන්න)

1. ලංසුකරුගේ සම්පූර්ණ නම :- ......................................
2. ජාතික හැඳුනුම්පත් අංකය :- ......................................
3. ස්ථිර ලිපිනය :- ......................................
4. සමාගමේ නම (තිබේ නම්) :- ......................................
5. සමාගමේ ලිපිනය :- ......................................
6. සමාගමේ ලියාපදිංචි අංකය :- ......................................
7. දුරකථන අංකය :- ස්ථාවර............................ජංගම : ............................ කාර්යාල : ............................
8. ෆැක්ස් අංකය :- ......................................
9. විද්‍යුත් තැපැල් ලිපිනය :- ......................................
10. වැට් ලියාපදිංචි අංකය :- ......................................
11. අදායම් බදු ගොනු අංකය :- ......................................
12. ලංසු වලංගු කාල සීමාව :- ......................................(අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.)
13. ඉල්ලුම් කරන මිල ගණන **(1.1 -1.7 දක්වා ලංසු අගයන් අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අගයන්හි යම් වෙනස් කිරීමක් සිදුකරන්නේනම් තනි ඉරකින් කපා නැවත සඳහන් කර කෙටි අත්සන යෙදිය යුතුය.)**

| අනු අංකය | කැබැල්ලක ප්‍රමාණය | ඉංජිනේරු ඇස්තමේන්තුව රු | ලංසු අගය (රු.) |
|---|---|---|---|
| 1.1 | ප්‍රමාණය හෙක්. 0.025 ක් දක්වා වූ කැබැල්ලක් සඳහා | 4,900.00 | |
| 1.2 | ප්‍රමාණය හෙක්. 0.05 ක කැබැල්ලක් සඳහා | 5,700.00 | |
| 1.3 | ප්‍රමාණය හෙක්. 0.1 ක කැබැල්ලක් සඳහා | 6,500.00 | |
| 1.4 | ප්‍රමාණය හෙක්. 0.2 ක කැබැල්ලක් සඳහා | 7,300.00 | |
| 1.5 | ප්‍රමාණය හෙක්. 0.4 ක කැබැල්ලක් සඳහා | 9,000.00 | |
| 1.6 | ප්‍රමාණය හෙක්. 1.0 ක කැබැල්ලක් සඳහා | 10,600.00 | |
| 1.7 | ප්‍රමාණය හෙක්. 2.0 ක කැබැල්ලක් සඳහා | 12,200.00 | |
| 1.8 | කැබැල්ලක ප්‍රමාණය හෙක්. 2.0 ඉක්මවන විට, අමතර හෙක්. 1.0 ක් සඳහා ගාස්තුව | 1,600.00 | ස්ථාවර |
| 2.1 | ප්‍රමාණය හෙක්. 0.05 දක්වා වූ ජල මාර්ග හා පෞද්ගලික / රජයේ මාර්ග සඳහා ගාස්තුව | 1,600.00 | ස්ථාවර |
| 2.2 | ප්‍රමාණය හෙක්. 1.0 ක ජල මාර්ග හා පෞද්ගලික / රජයේ මාර්ග සඳහා ගාස්තුව | 2,500.00 | ස්ථාවර |
| 3.1 | ජල මාර්ග ඔස්සේ ඇති රක්ෂිත සහ අනෙකුත් රක්ෂිත කැබලි සඳහා | 1.1 සිට 1.8 න් 50% | ස්ථාවර |
| 4.1 | පැරණි මැනුම් කැබලි නැවත නියැකීම සඳහා කැබැල්ලකට ගාස්තුව | 1.1 සිට 1.8 න් 15% | ස්ථාවර |
| 5.1 | පැරණි පිඹුරු කැඩැස්තර සිතියම් බවට පරිවර්තනය කිරීම සඳහා කැබැල්ලකට ගාස්තුව | 200.00 | ස්ථාවර |

සටහන :-

කැබැල්ලක බිම් ප්‍රමාණය ඉහත සඳහන් පරාසයන් තුල පවතින අවස්ථාවලදී ගාස්තු සමානුපාතිකව ගණනය කෙරේ.

උදා :- ප්‍රමාණය හෙක්ටයාර් 0.15ක කැබැල්ලක් සඳහා ගාස්තුව : $රු.6,500 + [\,(\frac{0.15-0.1}{0.2-0.1}) \times (7300-6500)]$

$= රු.\,6,900/-$

14. I. ලියාපදිංචි අංකය හා බලයලත් මිනින්දෝරුවකු ලෙස පළමුවෙන්ම ලියාපදිංචි වූ දිනය :-
.....................................................................................................................................
II. 2026 වර්ෂයට අදාලව ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවකු ලෙස ලබා ගත් වාර්ෂික බලපත්‍ර අංකය හා දිනය:-
.....................................................................................................................................
III. ප්‍රතීතන සහතික අංකය සහ දිනය :- ........................................................................................................
**(අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.)**

15. මැනුම් කටයුතු සඳහා යොදා ගැනීමට අපේක්ෂිත උපකරණය පිළිබඳ විස්තර
වර්ගය ...............................
මොඩලය.................................. නිරවද්‍යතාවය : කෝණික.............................. දුර..............................

16. සර්වේයර් ජනරාල්ගේ අධීක්ෂණය යටතේ පෙර වර්ෂවල කැඩැස්තර මැනුම් වල (පසුකාලීන මැනුම් හැර ) යෙදී තිබේද?
ඔව් / නැත

17. 16 සඳහා පිළිතුර "ඔව්" නම් නිම කරන ලද කැඩැස්තර මැනුම් පිළිබඳ විස්තර ( පසුකාලීන මැනුම් හැර )
**( ඉඩ ප්‍රමාණවත් නොවේ නම් කරුණාකර අමතර කඩදාසියක් භාවිතා කර අත්සන් තබා ලංසු පත්‍රයට අමුණන්න )**

| අනු අංකය | වර්ෂය | නිම කර ඇති කැඩැස්තර සිතියම් ගණන | මුළු කැබලි ගණන | ලැබුණු සංශෝධන මැනුම් ඉල්ලීම් ගණන | නිම කර ඇති සංශෝධන ඉල්ලීම් ගණන |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |
| 5 | | | | | |
| 6 | | | | | |
| 7 | | | | | |
| 8 | | | | | |

පහත අත්සන් කරන ලද මම ප්‍රකාශ කර සිටිනුයේ,

අ) උපග්‍රන්ථද (ඇතොත්) ඇතුලත්ව සියල්ල මා විසින් පරීක්ෂා කළ අතර ලංසු ලේඛනය සඳහා වෙනත් ඇතුලත් කිරීම් නැති බවද,

ආ) අවශ්‍යතා සහ පිරිවිතරයන්ට අනුකූලව ලංසු ලේඛන ඉදිරිපත් කරනු ලබන බවද,

ඇ) මගේ ලංසු පත්‍රය, ලංසු කරුවන් සඳහා උපදෙස් හි සඳහන් කාල සීමාව, නියම කරනු ලබන ලංසු ඉදිරිපත් කිරීමේ නියමිත කාලය සඳහා වලංගු වන බව සහ බැඳී සිටින කාලය මත එය පවතින බව සහ එම කාලසීමාව අවසන් වීමට පෙර ඕනෑම අවස්ථාවකදී එය පිළිගත හැකි බවද,

ඈ) මගේ ලංසුව පිළිගතහොත්, කොන්ත්‍රාත්තුවේ විය යුතු කාර්ය සාධනය වෙනුවෙන් වන කාර්ය සාධන බැඳුම්කරය ලබා දීමට මා බැඳෙන බවද,

ඉ) රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව හෝ මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් මා අසාධු ලේඛණගත කර නොමැති බවද,

ඊ) ඔබගේ ප්‍රධානය කිරීමේ දැන්වීමේ අඩංගු ඔබගේ ලිඛිත පිළිගැනීම සහිත මෙම ලංසු විධිමත් ගිවිසුමක් පිළියෙල කර ක්‍රියාත්මක කරන තුරු අප අතර බැඳුම් ගිවිසුමක් ඇති නොවන බවද

උ) ඔබට ලැබිය හැකි අවම අගයන් සහිත හෝ වෙනත් ඕනෑම ලංසුවක් භාර ගැනීමට ඔබ බැඳී නොමැති බව මා දන්නා බවද,

මම අවබෝධ කරගත් බවද ප්‍රකාශ කරමි.

අත්සන :- .....................................................................
(නම සහ තත්වය ඉදිරිපත් කරනු ලබන පුද්ගලයාගේ අත්සන ඇතුලත් කරන්න)
තත්වය:- .....................................................................
(ලංසු ප්‍රදානය කිරීමට ආකෘතිය අත්සන් කරන ලද තැනැත්තාගේ නීතිමය තත්වය ඇතුලත් කරන්න)
නම:- .....................................................................
(ලංසු ප්‍රදානය කිරීමට ආකෘතිය අත්සන් කරන ලද තැනැත්තාගේ සම්පූර්ණ නම ඇතුලත් කරන්න)

ලංසු අත්සන් කිරීමට නිසි බලයලත්:- ..................................................................... වෙනුවෙන්
(ලංසු කරුගේ සම්පූර්ණ නම ඇතුලත් කරන්න)

